# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2040/45 - 2017 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - 2017.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

IMDS/LND/05/ACQ/7500.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර: ගම් පුළුල් කිරීම යටතේ මෙන්තලාවත්ත නැමැති ඉඩම අත්පත් කර ගැනීම.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත කෝරළේ, කරදියමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, කරදියමුල්ල ගමේ අ.ග.පි. 380 අතිරේක 05 හි කැබලි අංක 112 ඉඩම පිළිබඳ විස්තර පහතින් සඳහන් කර ඇත.

ඉහත සඳහන් ඉඩමට /පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017.10.26 වැනි දින පෙ. ව. 09.30 ට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.10.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම /පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කැබලි අංක 112

ඉඩමේ නම: මෙන්තලාවත්ත; හිමිකම් කියන්නාගේ නම: එස්. කරුනාසිංහම්, මනිපේ දකුණ, මනිපේ; ප්‍රමාණය: හෙක්ටයාර් 6.0738.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්, ඉඹුල්පේ /ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
රත්නපුර දිස්ත්‍රික්කය.

2017 ඔක්තෝබර් මස 11 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

10-1635